<u>නිවේදනයයි</u>

<u>මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ</u>

<u>මාතලේ, ගලේවෙල, නුවරඑළිය, නාඋල සහ හඟුරන්කෙත අධ්‍යාපන කලාපවල</u>

<u>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම</u>

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මාතලේ, ගලේවෙල, නුවරඑළිය, නාඋල සහ හඟුරන්කෙත අධ්‍යාපන කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්:-**

01. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුයි.

02. ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සඳහන් I වන හෝ II වන උපලේඛනය යටතේ සිදුකරනු ලැබූ පූර්වාසන්න වසර 5/7/10ක වරදකට දඬුවම් නොලැබූ අයෙකු හෝ කිසිදු ආකාරයක විනය කටයුත්තක් පවතින හෝ එවැනි කටයුත්තකට භාජනය වීමට නියමිත අයෙකු හෝ නොවිය යුතුයි.

03. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 05ක් තුළ නියමිත පරිදි වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර, සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි.

04. අයදුම්පත් කැඳවන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන ඉහත සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

05. දැනට මධ්‍යම පළාතේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරියෙහි නියුතු නිලධාරියෙකු නම් එම තනතුරෙහි අවම වශයෙන් වර්ෂ තුනක (3) සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි.

**සටහන :-**

සුදුසුකම් සනාථ කෙරෙන සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකවල සහතික කල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුයි.

**තෝරා ගැනීමේ ක්‍රමය :-**

මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම මගිනි (අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය ඇමුණුම 02 ලෙස ඇතුළත් කර ඇත).

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :-**

සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2024.01.16 දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව සකස් කර **"ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ."** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මාතලේ, ගලේවෙල, නුවරඑළිය, නාඋල සහ හඟුරන්කෙත අධ්‍යාපන කලාපවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම."** යනුවෙන් සඳහන් කළ යුතුයි. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය භාරගනු නොලැබේ.

එච්.එම්. එම්.යූ.බී.හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.